රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ :02/2003

මගේ අංකය : II /309E110
රාජ්‍ය පරිපාලන කළමනාකරණ හා
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
2003.01.10

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානින්

## ජායා පිටපත් / අනු පිටපත් හා රිසෝග්‍රාෆ් යන්ත්‍ර ක්‍රියා කරවීම වෙනුවෙන් දීමනා ගෙවීම

තම නිත්‍ය රාජකාරියට අමතරව ජායා පිටපත්, අනු පිටපත් හා රිසෝග්‍රාෆ් යන්ත්‍ර ක්‍රියා කරවීමේ නිරත වන කාර්යාල සේවක සේවයේ නිලධාරින්ට පහත සඳහන් පරිදි දීමනාවක් ගෙවීම අනුමත කරමි.

02. ජායා පිටපත් යන්ත්‍ර ක්‍රියා කරවීම.

| මසකට පිටපත් සංඛ්‍යාව | මසකට දීමනාව |
|---|---|
| 1000 දක්වා - | දීමනාවක් නොමැත |
| 2000 දක්වා - | රු. 50/- |
| 4000 දක්වා - | රු. 100/- |
| 6000 දක්වා - | රු. 200/- |
| 8000 දක්වා - | රු. 300/- |
| 10,000 දක්වා - | රු. 400/- |
| 10,000 ට වැඩි- | රු. 500/- |

03. අදල මාසයේදී ලබාගන්නා ජායා පිටපත් ප්‍රමාණය අනුව ඉහත 02 ජේදයේ සඳහන් පරිදි ගාස්තු ගෙවිය හැක.

04. අනු පිටපත් යන්ත්‍ර සහ රිසෝග්‍රාෆ් යන්ත්‍ර ක්‍රියා කරවීම වෙනුවෙන් පිටපත් කරනු ලබන කොල 500 කට රු. 8/- බැගින් මසකට ගෙවිය හැකි උපරිම මුදල රු. 500/- කි.

05. තම නිත්‍ය රාජකාරියට අමතරව මෙම කාර්යයන්හි නිරතවන්නේ නම් පමණක් ඉහත දීමනා ගෙවිය යුතු අතර එක් යන්ත්‍රයක රාජකාරි වෙනුවෙන් දීමනා ගෙවිය යුත්තේ එක් අයෙකු සඳහා පමණි.

06. තවද මෙම සියලුම පිටපත් ගැනීම් පිළිබඳ අධීක්ෂණය ආසන්නතම මාණ්ඩලික නිලධාරියා විසින් කළ යුතු අතර අදල දීමනා ගෙවීමේදී ඔහුගේ නිර්දේශය ලබාගත යුතුය.

07. ඉහත ගෙවීම් 2003.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

08. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකගතාවය අනුව නිකුත් කරන ලදී.

ඩිටා විමලසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ හා
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය